# පොළොව හා අහස

## 13 තේමාව

R.N වත්තගේ

කෑ/මාව අල්පිටිය ක.වි

# පොළොව හා අහස

# 13 තේමාව



අප වාසය කරන මේ පෘතුවිය (පොළව) එක හා සමාන පරිසරවලින් යුක්ත නොවේ. කඳු,බෑවුම්,ගංගා,වැව් ආදී භූමිය මතුපිට විවිධ වූ ලක්ෂණ දැක ගත හැකි ය. එසේම මිනිසාගේ විවිධ ක්‍රියාකාරකම් නිසා ගෝලීය උෂ්ණත්වය ඉහළ යන අතර නොයෙක් ස්වාභාවික හා මිනිසා විසින් නිර්මාණය කරන ලද විපත් බහුල කාලයක අපි ජීවත් වෙමු. මේ බව තේරුම් ගෙන අපි පරිසරයට විපත් නොකර පරිසරය රැක ගත යුතු කාලයක් අද උදා වී ඇත.

## භූමියේ දැක ගත හැකි ලක්ෂණ



ක්‍රියාකාරකම 01

- ඔබ ඔබේ පාසල හෝ නිවස පිහිටා ඇති ප්‍රදේශය අවට භූමියේ වෙනස්කම් හොඳින් නිරීක්ෂණය කරන්න.

උදාහරණයක් ලෙස පහත රූපය දෙස බලන්න.

මෙම නිවස අවට භූමියේ පහත සඳහන් වෙනස්කම් ඔබට දැකිය හැක.

- කඳු
- ගංගා,ඇළ හා දොළ
- විල්
- තැනිතලා
- ගල්පර

ඈදී ලෙස.

මේ අනුව භූමියේ සෑම ස්ථානයක්ම එක සමාන නොවන බව ඔබට පැහැදිලි වනු ඇත.

- අප පාසල/නිවස අවට පරිසරය පමණක් නොව ශ්‍රී ලංකාවේ ද විවිධ භූ විෂමතා ලක්ෂණ දක්නට ලැබේ.

ඉහත සිතියම හොඳින් නිරීක්ෂණය කරන විට ඔබට එය හොඳින් පැහැදිලි වනු ඇත.

ඒ අනුව අපි දැන් ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගා,දිය ඇලි,කඳු,තැනිතලා හඳුනා ගනිමු

| ගංගාව | ආරම්භක ස්ථානය | මුහුදුට වැටෙන ස්ථානය |
|---|---|---|
| 1)මහවැලි | ශ්‍රී පාද අඩවිය(හැටන්) | ත්‍රිකුණාමලය |
| 2)කැළණි | සමනල කන්ද | කොළඹ |
| 3)කළු | සමනල කන්ද | කළුතර |
| 4)වලවේ | සමනල කන්ද | අම්බලන්ගොඩ |
| 5)මල්වතු ඔය | දඹුලු ප්‍රදේශය | සිලාවතුරෙයි |
| 6)මැණික් | නමුණුකුල කඳු | යාල |
| 7)ගිං | කබරගල කඳු | ගාල්ල |
| 8)කිරිඳි ඔය | නමුණුකුල කඳු | කිරින්ද |

- ශ්‍රී ලංකාවේ දිගම ගඟ - මහවැලි ගඟ
- ශ්‍රී ලංකාවේ උසම කන්ද - පිදුරුතලාගල
- ශ්‍රී ලංකාවේ උසම දියඇල්ල - බඹරකන්ද

ක්‍රියාකාරකම 02 (වර්ෂාව)

ගස් වැල් වලින්,ගංගා ඇළ දොළවලින් ජලය වාෂ්ප වන අතර ඉහල ආකාසේයේදී එම ජල වාෂ්ප වළාකුළු බවට පත්වී පසුව නැවත වර්ෂාව ලෙස පොළොවට පතිත වන බවත් ඔබ මේ වන විට හොඳින් හදුනාගෙන ඇත.එම ක්‍රියාවලිය අප ජල චක්‍රය ලෙස හඳුන්වමු.මෙසේ ඇද හැලෙන වර්ෂාව මුළු අවුරුද්ද පුරා විවිධ ආකාරයට අපට ලැබේ.

ඔබ ප්‍රදේශයට වර්ෂාපතනය ලැබෙන්නේ වසරේ කුමන මාසවලදී දැයි ඔබ වැඩිහිටියන්ගෙන් විමසා පහත වගුව සම්පූර්ණ කරන්න.

| වැඩියෙන් වැසි ලැබෙන මාස | මද වැසි ලැබෙන මාස | වැසි නොලැබෙන මාස |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

- වර්ෂාව බිමට පතිත වන විට පොළොවේ කුඩා වළවල් සෑදෙන බව ඔබ දැක ඇත.එසේම අධික වර්ෂාව වේලාවේ මිදුල පිරෙන්න ජලය එකතු වන ආකාරයත් එම ජලය මඩ පාට වන ආකාරයත් ඔබ දැක ඇත.එසේ සිදු වන්නේ ඇයි?
    - පොළොව සේදී යාම නිසයි.

වැඩි බෑවුම් ඇති ප්‍රදේශ,තණකොළ රහිත ප්‍රදේශ ගස් කොළන් රහිත ප්‍රදේශවල මෙලෙස පස සෝදායාමට ලක් වේ.

පියවර 01

දුවේ පුතේ ඔබ නිවසේදී පහත ඇටවුම සකස් කර හොඳින් නිරීක්ෂණය කර ජලය වැඩි පුර එකතු වන්නේ කුමන භූමියකද යන්න සොයා බලන්න.




- එවිට ඔබට ජලය වැඩිපුර රැස්වන්නේ තණකොළ ඉවත්කළ ස්ථානයේ බව පෙනී යනු ඇත.
- එසේම එම මඩ පැහැයෙන් යුක්ත බවත් අනෙක් බඳුනේ ජලය එසේ නොවන බවත් දැකිය හැකිය.
- ආවරණයක් නොමැති භූමියේ පස සේදී යන බව ඔබට මෙයින් දැකගත හැකිය.

පියවර 02

ඔබට පහත සඳහන් ආකාරයේ ඇටවුමක් සකස් කරගෙන ද පස සෝදා යන ආකාරය ද නිරීක්ෂණය කළ හැකි ය.

- මෙලෙස පස සේදීයාමට නොදී භූමිය ආරක්ෂා කර ගන්නා ආකාරය කෙසේද?

1. තණකොළ වැවීම
2. පැළ සිටු වීම
3. ගල් යෙදීම
4. පොල් ලෙලි ඇල්ලීම  සිදු කළ හැකිය

.

මොලස පස සේදී යාම,**පාංශු ඛාදනය** ලෙසද හැඳින්වේ.

ක්‍රියාකාරකම 03

ඔබට හැකිනම් වගුරු බිමක් ආශ්‍රිත ප්‍රදේශයකින් පස් ස්වල්පයක් හා ඔබ ගෙවත්තේ ස්ථානයකින් පස් ස්වල්පයක් ගෙන පහත ඇටවුම සකස් කරන්න.

මේ සඳහා

1. පස් නියැදි 2 ක්
2. වීදුරු දෙකක් (එක සමාන විනිවිද පෙනෙන)
3. සමාන ප්‍රමාණයේ ප්ලාස්ටික් බොතල් දෙකක් මැදින් කපා

ඇටවුම සකස් කර පස් නියදි දෙක සකසා ගත් බඳුන් දෙකට දමා සමාන ප්‍රමාණයේ ජලය එකතු කරගන්න.

ඉන්පසු හොඳින් නිරීක්ෂණය කරන්න.




එවිට ඔබට

- ජලය එක් කළ විට පස් දියවන ආකාරය
- පස් තුලින් ජලය ගමන් කරන ආකාරය
- පහලින් තබා ඇති බඳුනේ ජලය එකතු වන ආකාරය හා ජල ප්‍රමාණය දැකගත හැකියි.

පසුව ඔබට,

ජලය අඩු ප්‍රමාණයක් වගුරු ආශ්‍රිතව ලබා ගත් පස් නියදියේ එකතු වී ඇති බව හා මෙවැනි භූමියක් තුල ජලය වැඩිපුර රඳවා ගත හැකි බවත් ඔබට හඳුනාගත හැකි ය.

ඔබ දැනගත යුතුයි,

- ➢ වර්ෂාකාලවලදී වගුරු බිම්වලට ජලය වැඩිපුර රඳවා ගනීමේ හැකියාව ඇති බවත්
- ➢ එම වගුරු බිම් ගොඩ කර ඉදිකිරීම් සිදු නොකල යුතු බවත්
- ➢ එසේ නොවුනොත් ජලය රඳවා ගැනීමට ඇති ප්‍රදේශ අඩු වී ගංවතුර තත්ත්වයක් ඇති වන බවත්

ක්‍රියාකාරකම 04




- ❖ ඉහත සිතියම හෙඳින් නිරීක්ෂණය කරන්න.

1. ශ්‍රී ලංකාවට උතුරින් ඉන්දියාව ද
2. ශ්‍රී ලංකාවට දකුණින් ඉන්දියන් සාගරය ද
3. ශ්‍රී ලංකාවට නැගනහිරින් මැලේසියාව හා තායිලන්තය ද
4. ශ්‍රී ලංකාවට බටහිරින් අප්‍රිකානු රටවල් ද දැකිය හැකිය.

- ❖ ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයෙන් වට වූ දූපතකි.

ඔබ දැනගත යුතුය,

1. ශ්‍රී ලංකාවට වටා මුහුදේ ඇති මත්ස්‍ය සම්පත ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආහාර අවශ්‍යතාවයක් සපුරන බව
2. ධීවර කර්මාන්තය ඇසුරෙන් වෙරළබඩ පෙදෙස්වල ජනයා තම ජීවිකාව සිදු කරන බව
3. මුහුදු ජලයෙන් ලුණු වෙන් කර ගැනීමේ ක්‍රියාවලිය ලුණු ලේවා තුල සිදුවන බව
4. ප්‍රවාහන මාධ්‍යක් වශයෙන් ද මුහුද යොදාගන්න බව

❖ එසේම චන්ද්‍රයාගේ බලපෑම නිසා මුහුදේ ජල මට්ටම වෙනස්වීම නිසා වඩදිය හා බාදිය ඇති වේ.

වඩදිය : මුහුදු මට්ටම ඉහළ යයි.

බාදිය : මුහුදු මට්ටම පහළ යයි.

❖ මේ අවස්ථා දෙකේදී ගලා යන ජලයෙන් ද මුහුදු රළ උපයෝගී කරගෙන සමහර රටවල් විදුලිය නිපදවා ගනියි.

ක්‍රියාකාරකම 06

ගලා යන වාතය සුළඟ ලෙස හදුන්වන අතර සුළඟ සෙමෙන් ගමන් කරන විට සිසිලස දැනෙන බවත් සුළඟ වේගයෙන් හමන විට අපට සිදුවන සුළි සුළන් චන්ඩ මාරුත ඇති වී අනතුරු සිදුවන බයත් ඔබ දැක ඇත.

සුළඟින් ඇති ප්‍රයෝජන

1. සරුගල් යැවීම.
2. පරාගණයට හා බීජ ව්‍යාප්තයට
3. බොල් වී ඉවත් කිරීම.
4. සුලං යත් කැරකවීම මගින් විදුලිය නිපදවීම සහා ධාන්‍ය ඇඹරවීම.
5. දහඩිය හා තෙතමනය ඉවත් කර ගැනීමට.

සුලං පෙත්තක් කරකවා ගැනීම මගින් සරල කාරයයන් කර ගැනීමට හැකි වේ.

1. සුළඟට කැරකෙන සුළං පෙති මගින් ජලය ඉහලට ගැනීම.
2. සුළඟට කැරකෙන සුළං පෙති මගින් නළාවක් සෑදිම.

ක්‍රියාකාරකම 07



- සූර්යයා වටා පෘතුවිය ගමන් කරයි.
- පෘතුවිය වටා චන්ද්‍රයා ගමන් කරයි.
- පෘතුවියට අමතරව තව ග්‍රහවස්තු 7ක් සූර්යයා වටා ගමන් කරයි.(බුද,සිකුරු,පෘතුවි,අඟහරු,බ්‍රහස්පති,සෙනසුරු,යුරේනස්,නෙප්චූන්)
- පෘතුවිය තමා වටා කැරකැවීම භ්‍රමණය ලෙස ද තමා වටා කැරකැවී සූර්යයා වටා ද කැරකැවීම පරිභ්‍රමණය ලෙස හැඳින්වේ.

➢ සූර්යග්‍රහනය සිදුයන ආකාරය




➢ චන්ද්‍රග්‍රහනය සිදුවන ආකාරය




ක්‍රියාකාරකම 08

රාත්‍රී අහස ඔබ හොඳින් නිරීක්ෂනය කරන්න.එවිට ඔබට හඳ,තරු,උල්කාපාත,තරු රටා හා වල්ගා තරු දැක ගත හැක.එසේම හඳ විවිධ හැඩයෙන් ඔබට දැක ගත හැකි වේ.

සඳ නිරීක්ෂන පත්‍රිකායක් සකස් කර ඔබ හඳේ සුවරූපය හොඳින් දැක බලා සටහන් කරන්න.

## සඳ නිරීක්ෂණ පත්‍රකාව

| දිනය | සඳ දැකිය හැකි දිශාව | සඳේ හැඩය |
|---|---|---|
| | | |
| | | |
| | | |

- මෙහිදී ඔබට සම්පූර්ණම හඳ පසළොස්වක දිනට පසු දින දැකගත හැකි වනු ඇත.
- අමාවක දිනට හඳ නොපෙනෙන බවද දැක ගත හැකි වනු ඇත.

**ක්‍රියාකාරකම 09**

තරු අහසේ විවිද රටා මවන ආකාරය ඔබට දැක ගත හැකිය.



මහ බල්ලා



ඔරායන්



ගෝනුස්සා



දකුණු කුරුසය

හත් දින්නත් තරු



මහ වලසා

❖ ඔබ පොලොවේ හා අහසේ කියවෙන කවි ගීත එකතුවක් සකස් කරගන්න.

R.N වත්තගේ